# කලා ලොව හිතවතා යළිත් හමුවනු නැත!

## හිටපු කොළඹ නාගරික මන්ත්‍රී ටී. එම්. සංඝදාස මැතිතුමන්ගේ හදිසි අභාවය වෙනුවෙනි.

කලාකරුවන්ට ඒසා ප්‍රමාණයෙන් හිතවත් වූ ඔහු වැනි වෙනත් පුද්ගලයෙකු ශ්‍රීලංකාවේ සිටි බවක් මම මෙතුවක් අසා නැත්තෙමි. දෙසතියකට පෙර සිදුවූ ඔහුගේ හදිසි වියෝගය මා තුළ මෙන්ම ලංකා කලා ක්ෂෙත්‍රයේ සියළු දෙනා තුළම පාහේ දැනවූයේ අතිශය ශෝකයක් බව ඔවුන්ගේ ප්‍රතිචාරයන්ගෙන් පසක් කළෙමි. ටී. එම්. සංඝදාස නම් ඒ සුහද මිනිසා, සැබෑ කලාකරුවා, අවංක සහෘදයා, වැඩකරන ජනතාවගෙන් බිහිවූ සැබෑ සිනමා හා සංගීත රසිකයා නොමැකෙන අඩුවක් ඉතිරිකරමින් නොපෙනී යන්නටම ගියේ ය.

බොහෝ කලාකරුවන් සිනමා ශිල්පීන් ගායක ගායිකාවන්ගේ අභාවයන්හිදී ඒ කටයුතු නිසි ලෙස ඉටු කරන්නට මූලිකත්වය ගෙන ක්‍රියා කළේ සංඝදාසයන්ය. කලාකරුවෙකු ඔහුට පැවසූ කරදරයක් දුක්ගැනවිල්ලක් ඔහු තමාට වූ දෙයක් සේ සලකා ඊට අවශ්‍ය සහ කළයුතු දේ ඉටුකරන්නට ඉදිරිපත්වූයේ ස්වේච්ඡාවෙනි. ඒ කිසිවක් සඳහා ඔහු කිසිම දෙයක් බලාපොරොත්තු වූයේ නැත. එක්සත් ජාතික පක්ෂයටද, ආර් ප්‍රේමදාස ජනාධිපතිවරයාටද ඉතා හිතවත්ව සිටි සංඝදාසයන් කෙටි කලක් ග්‍රෑන්ඩ්පාස්හි නාගරික මන්ත්‍රීව සිටි අතර





***වසර විසිදෙකකට පෙර එනම් 1988 දි මා ශ්‍රීලංකාවට ගිය අවස්ථාවේ දි පත්කතුවර ආතර් යූ. අමරසේන මහතාගේ නිවසේ දි මට ටී. එම්. සංඝදාසයන් හමුවූ අවස්ථාවයි මේ. වම් කෙළවරේ වාඩිවී ඉන්නේ මාය. අනික් කෙළවරේ සංඝදාසයන් ය. ඒ මැද ඔහුගේ බිරිඳ ය. මට පිටුපසින් සිටගෙන සිටින්නේ ආතර් හා ශ්‍රියානි අමරසේන යුවළ ය.***

තවත් ටික කලක් ආර් ප්‍රේමදාස මහතා මියයන්නට ආසන්න කාල යේ චිත්‍රපට සංස්ථාවේ සභාපතිව ද සිටියේය. මේ මෑතක ඔහු වර්තමාන ජනාධිපතිවරයා විසින් එම සංස්ථාවේ උපදේශක තනතුරකට පත්කරනු ලැබ සිටියේය.

සංඝදාසයන් අයත්වන්නේ අපද අයත් වන සිනමාවේ මුල් යුගයේ රසික පරම්පරාවටය. ඒ යුගයේ සිනමා රසිකයන් බොහෝ දෙන විසින් හඳුන්වනු ලැබූයේ බයිස්කෝප් පිස්සන් ලෙසිනි. සිංහළ හෝ හින්දි චිත්‍රපටයක් මුල් දවසේම පෝළිමේ පොරකා, ගැලරියේ බලා, සත දහයකට හෝල් එකෙන්ම ඒ චිත්‍රපටයේ සිංදු පොතක් මිළදී ගෙන, හෝල් එකෙන් පිටවූ මොහොතේ සිට පාර දිගේ ඒ පොතේ සිංදු හරි තාලයට නැතත් හැකි තාලයකට කෑගසා ගායනා කරමින් ද, චිත්‍රපටයේ ෆයිට් අනුගමනය කරමින් ඩිෂුම් ඩිෂුම් යයි අත පය වනමින් ද ගෙදර ආ කොළු පරම්පරාව මේ යුගයේ අය නොදනිති. ඒ සැබෑ රසිකත්වය වැඩිහිටියන් වූ පසු අප බොහෝ දෙනෙකු ගෙන් මැකී ගොස් ඇති නමුදු සංඝදාසයන් කෙරෙන් අවසාන මො-හොත දක්වාම ගිලිහී නොයාම ඔහු කලාකරුවන් වෙත අපමණ ස්නේහයකින් බැඳී කටයුතු කරන්නට මූලික වූ හේතුව බව නිසැක ය.

මා සංඝදාසයන් මුල්වරට හඳුනාගත්තේ 1970 දී පමණ ය. කොළඹ පිටකොටුවේ මහ වෙළඳ පොළේ එළවළු කඩයක් හිමිව සිටි මගේ හිතවතෙකු වූ විජේරත්න නම් ව්‍යාපාරික තරුණයාගේ කුඩා දියණියගේ උපන්දින සාදය පැවති කැළණියේ නිවසට ගිය අවස්ථාවේදීය. ඔහු ටී. එම්. සංඝදාස ලෙසින් විජේරත්න මට හඳුන්වා දුන්නේ ය. ආර්. ප්‍රේමදාස මහතාගේ දේශපාලන ප්‍රචාරක කටයුතු වලට ඔහු සම්බන්ධව සිටින බව ද කීවේ ය. ක්ෂණිකව මා හා මිතුරුවූ ඔහු මා එකල පුවත් පත්වලට ලියා තිබූ සිනමා ලිපි කියවා ඇති බව ද පැවසීය. අප සාදය යන අතරේ ද එදා කතා කළේ සිංහළ චිත්‍රපට ගැන ය.

යළිත් සංඝදාසයන් හමුවුණේ බොහෝ කලකට පසු මා ලංකාවට ගිය අවස්ථාවකදී ය. එහෙත් ඔහු ඒ පරණ හිතවතාම විය. කලාවට, සිනමාවට, සංගීතයට හා කලාකරුවන්ට ඔහු වෙත තිබූ ඇල්ම තවත් වැඩිවී තිබුණි. කලාකරුවන් අසරණව සිටින අවස්ථාවන් හි ප්‍රේමදාස මහතාට ඔවුන් ගැන කියා උනන්දු කරවා ඔවුන්ට සහනයක් සැලසීම සංඝදාසයන් අතින් අප්‍රමාදීව සිදුවිය.

සිංහළ සහ හින්දි සිනමාව ගැන ඔහු තුළ තිබූ දැනුම පුදුම එළවන සුළුය. එසේම බොහෝ පැරණි චිත්‍රපට නිර්මාණය වූ ආකාරය පිළිබඳ සියළු තොරතුරුද, ගීතයන්හි නිවැරදි පදමාලාවන්ද මතකයෙන් කියන්නට තරම් ඔහු සුවිශේෂ සමතෙකු විය. ඔහුගේ වියෝගය මුළු කලා ලෝකයටම පාඩුවක් වන්නේ එවැනි මතක සටහන් මැකී ගිය නිසාත් ඒ තැන පුරවන්නට වෙනත් කෙනෙකුට නොහැකි නිසාත් ය.

සංඝදාසයන්ගේ පෞද්ගලික හා දේශපාලන ජීවිතය ද විවිධ හැලහැප්පිලි වලින් ගහන වූවකි. ඔහු එක්සත් ජාතික පක්ෂය හා විශේෂයෙන් ආර්. ප්‍රේමදාස මහතා වෙනුවෙන්, ඔහුගේ දේශපාලනය වෙනුවෙන් ඇප කැපවී කටයුතු කළ කෙනෙකි. ඒ නිසාම විශාල කරදර වලටද ඔහු මුහුණ දුන්නේය. ඒ බොහෝ පුද්ගලික කරුණු ඔහුගේ සමීප හිතවත්තු දනිති. සංඝේ අවසන පක්ෂය සමග ද, එහි ඇතුලාන්තය සහ නායකත්වය ගැනද දැඩිලෙස කළකිරුණේය. ඔහු වත්මන් රජය කෙරෙහි පක්ෂපාතී වූයේ ද ඒ නිසාම ය. ජනාධිපතිවරයා සංඝදාසයන් චිත්‍රපට සංස්ථාවේ උපදේශක තනතුරකට පත්කළේ සංඝේ තුළ අවංකවම සිංහළ සිනමාවට ඇති ලැදිකම ද, කලාකරුවන් වෙනුවෙන් ඔහුගේ ඇති අවංක කැපවීම අගැයීමක් ද වශයෙනි.

ලංකාවිත්ති පුවත්පත මා මුලින්ම යැවූ විට ඒ ගැන පැහැදී මෙන් යුතුව කථා කළ ඔහු පිටරටක සිංහළ පත්‍රයක් ඇරඹීම ගැන නොවක්ව ප්‍රශංසා කර සුබපැතුම් පතක් එව්වේය. මම පුවත්පත එදා සිට හැම මසකම ග්‍රෑන්ඩ්පාස්හි බ්‍රිටෝ බබාපුල්ලේ පෙදෙසේ ඔහුගේ නිවසට තැපැල්කර යැවූවෙමි.


සංඝේ මට අවසන් වරට මුණ ගැසුණේ ගිය වසරේ අප්‍රේල් මාසයේ අවුරුදු සමයේ මා ලංකාවට ගිය අවස්ථාවේදීය. සිංහළ අවුරුද්දට පසුදා තිස්ස අබේසේකරයන් රෝගාතුරව අසාධ්‍ය තත්වයේ සිටි නිසා කොළඹ හුණුපිටියේ ගංගාරාමයේ බෝධි පූජාවක් පැවැත්වෙන බව සැළවී මමද එයට සහ-භාගි වීමි. එදා එහි සිනමා, නාට්‍යය, සංගීත හා පුවත් පත් ආදී සියළු ක්ෂෙත්‍රවලට අයත් විශාල පිරිසක් වීය. එය සංවිධානයකර තිබුණේ සංඝදාසයන්ගේ කලා ලංකා පදනම මගිනි.

දින කීපයකට පසු තිස්ස අබේසේකරයන්ගේ අවමඟුල දා සුසාන භූමියේ දී යළිත් සංඝේ මට හමුවුණි. එදා ඔහු සිනාසෙමින් කීවේ “ අපිත් කොයි වෙලාවක හරි දන්නෙම නැතුව යාවි..... ජීවිතේ කියන්නෙ ඉතින් බයිස්කෝප් එකක් තමයි....” කියා ය.

බොහෝ ලෙන්ගතු මිතුරෝ සැතපුම් හත්දහසක් ඈතින් සිටිති. ඒ මහා දුර මගේත් ඒ හිතෛෂීන් අතරත් වන යහළුකමට කිසිදු බාධාවක් නොවීය. නොවන්නේ ය. ඔවුන් ගැන මා තුළ මෙන්ම, මා ගැන ඔවුන් තුළ ද ප්‍රසන්න මතක සටහන් පවතින බව මම දනිමි. එහෙත් ඒ දුරස්ථභාවයම දුකක් ලෙස මාතුළ හැම දා පවතී.


සංඝදාස සහෘදයාණන්ට නිවන්සුව අත්වේවා !

♦ දයා ආනන්ද




# Food that makes you suffer for life!

# ජීවිතේටම විඳවන්නට සිදුවන කෑමක්!



A doctor was addressing a large audience in Tampa -a city in Hillsborough County, Florida, USA.

“ The material we put into our stomachs is enough to have killed most of us sitting here, years ago.

“ Red meat is awful. Soft drinks corrode your stomach lining.”

“ Chinese food is loaded with MSG -that is Mono Sodium Glutamate, also known as Ajinimoto.”

“ High fat diets can be disastrous, and none of us realizes the long-term harm caused by the germs in our drinking water.”

“ But there is one thing that is the most dangerous of all, and we all have eaten, or will eat.

Would anyone care to guess what food causes the most grief and suffering for years after eating it....? ”

After several seconds of quiet, a small 75-year-old Jewish man in the front row, raised his hand and said, “ Wedding Cake ? ”

ඇමරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරිඩාහි නගරයක් වන ටැම්පාහි සායනයකට පැමිණි වෛද්‍යවරයෙක් එම ශාලාවේ රැස්වූ පිරිස ඇමතුවේ ය. එදින ඔහුගේ මූලික අදහස වූයේ කෙනෙක් දිනපතා ගන්නා සමහර ආහාර කොපමණ හොඳයයි පිළිගෙන තිබුණත් ඒවායේ ශරීරයට හානිකර ද්‍රව්‍ය අඩංගු වී ඇති බව පෙන්නා දීමට ය. ඔහු මෙසේ කතාව ආරම්භ කළේ ය.

“ දැන් බලන්න අපේ බඩ ඇතුළට අපි මේ දාගන්න දේවල් ගැන කල්පනා කළොත් ඇත්තටම මෙතන ඉන්න අපි ඔක්කොම එහෙනම් මැරිලා හුඟක් කල්. ”

“ රතු මස් වර්ග අන්තිම නරකයි..... ඔය කෑන් වල එන පැණිරහ බීම ජාතිවලට ආමාශයේ ඇතුල් පැත්ත සම්පූර්ණයෙන් ම මළකඩ කෑවා වගේ විනාශ වෙනවා.....”

“ චීන කෑම හැම එකකකම මොනෝ සෝඩියම් ග්ලූටොමේට් කියන රසායනික ද්‍රව්‍යය පිරිලා... ඒවට කියන තව නමක් තමයි අජිනෝමොටෝ..... ඒව අන්තිම නරකයි.....”

“ අධික තෙල් සහිත ආහාර හරිම නරකයි. ඒ වගේම අපි දිනපතා බොන වතුරේ ඇති විෂබීජ ප්‍රමාණය ශරීරයට මාරාන්තිකයි....”

“ නමුත් මේ සියල්ලටම වඩා දරුණුම ආහාරයක් තියනවා.... ඒවා අපි කවුරුත් කාලා තියනවා... දැනුත් කනවා... ඉදිරියටත් කන බව මම දන්නවා.... හැබැයි කෑවට පස්සෙ මුළු ජීවිතේටම දුක්වෙන්න වෙනවා... විඳවන්න වෙනවා.... ”

“ කාටද නිකං අනුමාන කරන්න පුලුවන් ඒ කෑම ජාතිය මොනවද කියලා....? ”

මඳක් නිශ්ශබ්දතාවකින් පසු ඉදිරිපෙළ වාඩිවී සිටි වයස 75 ක් පමණ වයසැති කුඩා යුදෙව් ජාතිකයෙක් අත ඔසවා මෙසේ කීය.

“ වෙඩිං කේක්....”

♦ දීපා සඳමාලි හේරත්
*Deepa Sanadamali Herath - USA*